# ගොවිගම කුලයේ සාම්ප්‍රදායික කාර්යභාරය

උඩුගම්පොල ගුණානන්ද හිමි

බුදුදහම කුල භේදය නොපිළිගන්නා හෙයින් බුදුදහම බල පවත්නා රටක කුල භේදය නොපැවතිය හැකි වුව ද කරුණු කිහිපයක් නිසා සිංහලයෙහි කුලභේදය පවතියි. හින්දූන් කුල භේදය තදින් ම පිළිගැනීමත් ඉන්දියාව හා ලංකාව අතර පැවති කිට්ටු සම්බන්ධතාවයත් ඉන් ප්‍රධාන කරුණු වේ.[1] විවිධ කුලවලට අයත් කාර්මිකයින් ඉන්දියාවේ සිට ලංකාවට නිතර නිතර පැමිණීම නිසා ලංකාවේ ද ඊට සමාන කුල ඇති වී කුල හැඟීම දියුණු වූ බව පෙනේ. වැඩවසම් ක්‍රමය ද මීට තවත් හේතුවක් වූ බව පෙනේ. මෙසේ හේවායකුගේ පරවේනියක් (ඉඩම් කොටසක්) හේවායකුටත්, ලෝකුරුවකුගේ පරවේණියක් ලෝකුරුවෙකුටත්, බඩහැලයකුගේ පරවේණියක් බඩහැලයකුටත් ආදී වශයෙන් ඒ ඒ පරවේණි ඒ ඒ වෘත්තීන්හි යෙදී සිටින්නන්ට පමණක් අයත් වූ හෙයින් වෘත්තිය අනුව කුල භේදය හැඩ ගැසී ස්ථාවර විය.[2] අන් ගනයකට අයත් පරවේණියක් ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවුන බවත් හැම දෙනාම තම කුලය ගැනම සැලකිලිමත් ව එය නොනසා ආරක්ෂාකර ගැනීමට උත්සාහ කළ බව ද මෙහිදී තේරුම් ගත යුතුය. එසේ ම ඒ ඒ කුල වලට විශේෂ වරප්‍රසාද හිමිව තිබූ හෙයින් කුල භේදය පිළිබඳ සංකල්පය කිසිවෙකුටත් අතෘප්තිකර එකක් නොවීය.

කුලය දකුණු ආසියාවේ අතීතයේ සිට පැවත එන මූලික සමාජ සංස්ථාවකි. ඇතැම් බටහිර සමාජ විද්‍යාඥයින් දකුණු ආසියාතික සමාජයට විශේෂයෙන් හින්දු සමාජයට ආවේණික වූ



සුවිශේෂ සහ මූලික ලක්ෂණයක් ලෙස දකිනුයේ සමාජය කුල වශයෙන් පෙළ ගැසී තිබීමත්, ඊට අනුකූල වූ කුලවාදී චින්තනයක් සමාජයේ මුල්බැසගෙන තිබීමත්ය.[3] ඉන්දියාවේ හින්දු කුල ක්‍රමය මුල්කරගෙන හින්දු ආගමික විශ්වාස සමඟ තදින් බැඳුණු සමාජ සංස්ථාවකි. එහි වර්ණ හා ජාති වශයෙන් කුල ක්‍රමය ක්‍රියාත්මක විය.[4]

සිංහල කුල ක්‍රමය පිළිබඳව සැලකීමේ දී හින්දු සමාජයේ මෙන් ම ඒ ඒ පුද්ගලයා ජන්මයෙන් ලද කුල තත්ත්වය අනුව සමාජයේ ඉහළ නැගිය නොහැකි පියගැට පෙළක් සේ අභ්‍යන්තරික වශයෙන් බෙදී පවතියි.[5] එහෙත් සිංහල කුල ක්‍රමය වර්ණ ආකෘතිය අනුව තේරුම්ගත නොහැක.

බ්‍රාහ්මණ ක්ෂත්‍රිය අය පිළිබඳ ලංකා ඉතිහාසයේ විවිධ වකවානුවලට අයත් ලිපිවල සඳහන් ව ඇති නමුත් ඔවුන් සිංහල කුල ක්‍රමයේ නිත්‍ය කොටස් වූ බවට සාක්ෂි නැතැයි හේම එල්ලාවල මහතා සඳහන් කරයි.[6] සිංහල කුල ක්‍රමය හැඳින්වීම ජාති යන පදය ව්‍යවහාර වීමෙන් හින්දු කුල ක්‍රමයේ ඇතැම් සංකල්ප ඇතුළත්වී ඇති බව කාලිංග ටියුඩර් මහතා දක්වයි.[7]

සිංහල කුල ක්‍රමයේ ආරම්භය හා පරිණාමය පිළිබඳව ඉතිහාසඥයන් අතර විවිධ මත පවතියි. සිංහල සමාජයේ ආරම්භයේ සිට ම පාරම්පරිකව උරුම වූ සමාජ විෂමතා ක්‍රමයක් පැවති බව ඉතිහාසඥයින් වැඩි දෙනෙකුගේ මතයයි.[8] වර්තමානයේ සිංහල ජනසමාජයේ පවතින කුල සංයුතිය මධ්‍යතන යුගය වන විට බොහෝ දුරට සංවිධානය වී තිබුණි.[9] එතෙක් කුල ක්‍රමය වඩාත් සංවිධානාත්මක ලෙස ආයතනගත වූයේ මහනුවර යුගයේ දීය.[10] එයට හේතුව වැඩවසම් සමාජ ක්‍රමය බිහි වීමයි.

සෑම සිංහලයෙක් ම කුල ක්‍රමයේ කොටස්කරුවෙකු ලෙස සැලකිය හැකිය. නමුත් සිංහලයන් අතර කුල ක්‍රමය අනුව ප්‍රාදේශීය විෂමතා පවතියි. විවිධ විෂමතා ප්‍රාදේශීය වශයෙන්, ග්‍රාමීය වශයෙන්, උඩරට, පහතරට වශයෙන් පැවතියත් සමස්ථ සමාජයට ම පොදු වූ කුල සංයුතියක් හා කුල ධුරාවලියක්

පිළිබඳව සැලකිය හැකිය. ඒ අනුව ශ්‍රී ලාංකික සාමජය තුළ ගොවිගම කුලය ප්‍රධාන කරගත් කුල ධූරාවලියක් ක්‍රියාත්මක වන බව පැහැදිලිය. මෙහි දී අප අවධානය යොමුකරනු ලබන්නේ ගොවිගම කුලයේ සාම්ප්‍රදායික කාර්යභාරය පිළිබඳවයි.

සිංහල සාමජයෙහි විශාල ම හා උසස් ම කුලය වන්නේ ගොවිගම කුලයයි. සමස්ථ සිංහල ජනගහනයෙන් 50% ක් පමණ අයත් යැයි සැලකේ.[11] ගොවි කුලය තවත් උප කුලවලට බෙදී ඇති බව මූලාශ්‍ර පරීක්ෂා කිරීමේ දී හෙළිවේ. ඒ අනුව ප්‍රධාන කොටස් තුනක් දක්නට පුළුවනි.

1. රදළ
2. ගොවිගම
3. පට්ටි[12]

ගොවිකුලය පිළිබඳව සැලකීමේ දී සිංහල කුල ක්‍රමයේ ඉහළ ම ස්ථරය නියෝජනය කළ කුලය වශයෙන් වංශවත් කුලීන කුලයක් ලෙස ක්‍රියාත්මක විය. පොදුවේ සැලකීමේ දී ඔවුන්ගේ ප්‍රධානතම කාර්ය වශයෙන් ගොවිතැන් කිරීම දක්නට පුළුවනි. ඊට අමතරව ඔවුන් අතර පැවති අතුරු බෙදීම් අනුව සමාජයේ විවිධ කාර්යභාරයන් ඔවුන්ට හිමිව තිබූ බව පෙනේ. ගොවි කුලය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තයෙහි යෙදුනු අතර වෙනත් කුලවලට සේවා සැපයීමට බැඳී සිටියේ නැත. එහෙත් රජු වෙනුවෙන් විශේෂිත සේවා කිරීම නිසා ගොවි කුලය ඉහත දැක්වූ ආකාරයට ප්‍රභේද වලට බෙදී තිබුණු බව පෙනේ. රාජකීය සේවාවේ උසස් තනතුරු සඳහා තෝරාගනු ලැබූයේ ගොවි කුලයේ සාමාජිකයන්ය. කල්යත්ම ඔවුන් රදල නමින් විශේෂ කොටසක් වශයෙන් පෙනී සිටින්නට විය. මෙම රදළ ස්ථරය ගොවිගම කුලයේ ඉඩම් හිමි ප්‍රභූ පිරිසයි. මොවුන් බොහෝ සෙයින්ම උඩරට සමාජයෙහි කැපී පෙනෙන කණ්ඩායමකි. උඩරට සාමාජයේ උසස් සිවිල් පරිපාලන හා පූජ්‍ය ස්ථාන පරිපාලන කටයුතු බල අධිකාරීය සහ ගරු බුහුමන් රදළ පැලැන්තියට සීමාවිය. පසු කාලයක සංග්‍රාමීය හා රාජ්‍ය තාන්ත්‍රික ඥාණය නිසා ඇතැම් යුරෝපීයයන් ද රාජ්‍ය සේවයට බඳවාගනු ලැබීය. ඔවුන් කන්ද උඩරට නිත්‍ය පදිංචිකරුවන් බවට පත්විය.



කාලයත් සමග ඔවුන් උඩරට ගොවි කුලය සමග අවාහ විවාහ සබඳතා ඇතිකරගෙන ගොවි කුලයටම සම්බන්ධ වූ බව පෙනේ. මෙම පිරිසද රදළ කණ්ඩායමට එකතු වූහ. මෙවැනි උසස් තනතුරු වලට තෝරා ගත්තවුන්ට රජුගෙන් ඉඩම් ප්‍රදානය කෙරුණු අතර එවැනි ඉඩකඩම් සංවර්ධනයේ දී කුලහීන ජන කොටස් යොදා ගනිමින් ඔවුහු වංශක්කාර තත්වයකින් ඉඩකඩම් වල කටයුතු වලින් ඈත්ව රාජකාරී කටයුතු වල පමණක් යෙදුණු කොටසක් සේ පෙනී සිටින්නට වූහ.[13] ඔවුන් රාජ්‍ය සේවාවේ උසස් තනතුරුවල ම කටයුතු කළ පිරිසක් විය. ඒ බව ඔවුන්ට ආවතේව කිරීම සඳහා සැලකිය යුතු ගෘහස්ථ සේවක පිරිසක් මෙන්ම නිලයේ මහේශාක්‍ය බව තහවුරු කළ පරිවාර පිරිසක් ලැබීමෙන් ද පැහැදිලි වේ.[14]

මෙම පිරිස සතුව සාම්ප්‍රදායික බලයක් පැවතුණි. ඇඳුම් ආයිත්තම් වලින් සැරසී මහේශාක්‍ය ලෙස ඔවුන් ක්‍රියාකළහ. රන් ආභරණ පැළඳීම ඔවුන් සතුව පමණක් පැවතුණි. ගෙවල් දොරවල් තනා ගැනීම, යාන වාහන යොදා ගැනීම ආදියෙහි ඔවුන්ට විශේෂත්වයක් පැවතුණි. දෝලාවල ගමන් කිරීම අවි අතු දරන්නන්, කස කරුවන් ඇතුලු පරිවාර සේනා සහිතව තම බල ප්‍රදේශයෙහි සංචාරය කිරීම ද ඔවුන්ට හිමි වරප්‍රසාද විය. ඊට අමතරව විධායක බලයට අනුකූල අධිකරණ බලතල ද හිමිවිය. ඒ නිසා ඔවුන් සිංහල සමාජය තුළ ප්‍රබල තත්වයකට පත් වී සිටියේය.

රාජකීය පාලන තන්ත්‍රයේ උසස් තනතුරු දැරුවේ රදළ පවුල්වල අයයි. රාජ්‍ය තන්ත්‍රයේ උසස් තනතුරු පවුල් කිහිපයක් අතර පැවතුණි. මෙම කොටසට අයත් පිරිස ද රදළයන්ට මෙන්ම උසස් රාජකීය නිලධරයන් මෙසේ ක්‍රියා කළේය. මේ අනුව අධිකාරම්, දිසාව, කෝරළ, මුදලි, ආදී ප්‍රධාන තනතුරු දරන්නන් බවට ඔවුහු පත් වූහ. මෙම පිරිස මුදලි පේරුව ලෙස ද හඳුන්වා ඇත.[15] මේ අනුව මුදලිවරුන් රජයේ උසස් තනතුරු දැරූ පිරිසක් විය. කුලහීන යැයි සම්මත ජනකොටස්වල, රාජකාරී සේවය සංවිධානය කිරීමට ද ගොවිකුලයේ අයගේ

කාර්යභාරයක් විය. එවැනි අවස්ථාවල ප්‍රශ්න කිරීමකින් තොරව එම කටයුතු කුලහීන කොටස් පිළිගත් බව පෙනේ. උඩරට රාජධානියේ නින්දගම් ලාභීන් වූයේ මුදලි වරුන්ය. සේවා පරවේනි වලින් වැඩි කොටසක් හිමි වූයේ ද ඔවුන්ටය. එම නිසා උඩරට සමාජයේ විශාල ඉඩම් හිමියන් වශයෙන් ඔවුන් පෙනී සිටියේය. රජුගෙන් පැවරුණ මෙම අධිකාරී බලය නිසා ඔවුන් කිසියම් ප්‍රමාණයක පිරිස් බලතල සහිත ව ප්‍රාදේශීය බලවතුන් ලෙස පෙනී සිටි බව පෙනේ.[17] ප්‍රාදේශීය වශයෙන් හමුදා සංවිධානය කොට ඔවුන් සටන් පෙරමුණට ගෙන ගියේ ද ඔවුන්ය. ඔවුන් ප්‍රදේශයේ අධිකරණ නිලධාරියා වීම නිසා මෙම තත්ත්වය වඩාත් ශක්තිමත් විය.[18] මේ නිසා ඔවුන්ගේ තවත් කාර්යභාරයක් වූයේ සටන් සඳහා හමුදාව සංවිධානය කිරීමයි. මේ අනුව රදළවරුන් මෙන් ම මුදලිවරුන් ද ගොවිගම කුලයේ උසස් ස්ථරය නියෝජනය කරමින් ක්‍රියාකළ බව පෙනේ.

රදළ හා මුදලි උපකොටස්වලට පහළින් වූයේ රටේ ඇත්තන් නමින් හැඳින්වූ කොටසයි. මෙය පයින්ඩ පේරුව ලෙසඳ හඳුන්වා ඇත. රදළ හා මුදලිවරුන්ගෙන් පත්කළ නිලතල ළඟට අනෙක් නිල පත්වීම් කෙරුණේ රටේ ඇත්තන්ගෙනි. ගොවිගම කුලයේ විශාල ජන බහුතරයක් මෙම පයින්ඩ පේරුව නියෝජනය කළහ.[19] රටේ ඇත්තන් තමන් විසින්ම කුඹුරු ගොවිතැන් කළ අතර කන්ද උඩරට රාජධානියේ ආරම්භක අවස්ථාවේ රාජ්‍ය භාණ්ඩාගාරයට ධාන්‍ය සැපයුණු රාජකාරිය ද කරන්නට විය. එසේ ම උඩරට රජතුමාගේ හමුදාවේ සේවය කළ වැඩිදෙනා රටේ ඇත්තන් විය. පසුව යුද්ධ කාර්යයේ විවිධ කොටස් ප්‍රගුණකළ හමුදාවක් ගොඩ නගන ලදී. ඒවා භාරව ක්‍රියා කළේ ද රටේ ඇත්තන් අතරින් පත්කළ අතපත්තුවේ අයයි.[20] මේ නිසා රටේ ඇත්තන් නමින් හැඳින්වූ ගොවිගම උප කුලය විශාල කාර්යභාරයක් සිදුකළ බව පැහැදිලි වෙයි.

ගොවිගම කුලයේ තවත් උප කුලයක් වූයේ පට්ටිවරුන්ය. මොවුන් මුල් කාලයේ එඬේරුන් වශයෙන් ගව පට්ටි පවත්වාගෙන ගිය බව පෙනේ. ගව පාලන කටයුතු කරමින් කෘෂි කර්මාන්තයෙහි නියැලීම මොවුන්ගේ ප්‍රධාන කාර්යභාරය විය.



ශ්‍රී ලංකාවේ කුල ධුරාවලිය -පිළිබඳව දක්වා ඇති විස්තර අනුව ගොවිගම කුලයේ සාම්ප්‍රදායික කාර්යභාරයන් පිළිබඳව සැලකිය හැකිය. විශේෂයෙන් උඩරටත්, පහතරටත් සංවිධානය වී තිබූ ගොවිගම කුලය විවිධ උපකොටස්වලට බෙදා දක්වා ඇත. එම උප කොටස්වල කාර්යභාරයන් සැලකීමේ දී ගොවිගම කුලය විවිධ කාර්යයන්හි නිරතව සිටි බව පැහැදිලි වේ.

නීති නිගණ්ඩුව නම් පුරාණ ග්‍රන්ථයෙහි සිංහල කුල ධුරාවලිය පිළිබඳව තොරතුරු දක්වා ඇති අතර ගොවිගම කුලයට අයත් විවිධ උපකුල පිළිබඳව හා ඒවාට අදාල කාර්යයන් දක්වා ඇත. ඒ අනුව ද ගොවිගම කුලයට අයත් වූ කාර්යභාරයන් දැනගත හැකිය එනම්,

1. රදළ ගම් පේරුව හෙවත් මුදලි පේරුව - රජයේ උසස් තනතුරු දැරූ අය
2. පයින්ඩ පේරුව හෙවත් රටේ ඇත්තන් - සුළු තනතුරු දැරූ අය
3. නිලමක්කාරයෝ නිලතල දැරූ අය
4. පට්ටිවල අය ගව පාලනය කළ අය
5. වීරමේස්ත්‍රීගොල්ල පේන කියන්නෝ, විජ්ජාකාරයෝ.
6. පොරෝකාරයෝ කාර්‍ය්‍යාංශයෙහි මුලාදෑනීහු
7. ඇත්වල පනික්කියෝ අලි බැලූ අය
8. බලිබත් ගමයෝ බලි පැවැත්වූ අය[21]

මුහුදුබඩ ප්‍රදේශවල පැවති කුල පිළිබඳව තොරතුරු මහමුදලි ඒ. ද. සරම් විසින් 1832 දී ලියන ලද ලිපියකින් හෙළි කරයි. එහි දැක්වෙන කුල ලේඛනයෙහි ද ගොවිගම කුලයේ උප කුළ හා ඊට අදාළ කාර්යන් දක්වා ඇත.

එහි දී ඔහු ගොවිකම කුලය ප්‍රධාන වශයෙන් වෙල්ලාල යනුවෙන් දක්වයි. වෙල්ලාල කුලයේ උපකුල පහක් දක්වා ඇත.

1. අප්පුහාමිලා - මුලාදෑනි තනතුරු දැරූ අය
2. සපරමාදු අප්පුහාමිලා - පාරම්පරික පටබැඳි පිරිසක්

3. හේවා පන්නේ - හේවායෝ හෙවත් හේවාපන්න කාරයෝ
4. කාරියවසන් - ගමරාළලා
5. වැඩවසම්කාරයෝ - පාලම් ආදිය තනන්නෝ[22]

ලංකාවේ මුහුදුබඩ පළාත් යුරෝපීයන් යටතට පත්වීමෙන් පසු එක් එක් කුලයට අයත් කාර්යන් යම් ප්‍රමාණයකින් මිශ්‍ර වූ බව 1818 දී ආණ්ඩුවේ කැලැක්ටර්වරුන් විසින් ශ්‍රීමත් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කළ වාර්තාවන්ගෙන් ඔප්පු වේ. එම වෙනස්වීම් ගොවිගම කුලය කෙරෙහි ද බලපා ඇති බව කිව යුතුය. කළුතර දිස්ත්‍රික්කයේ වාසය කළ විවිධ කුලවලට අයත් පුද්ගලයන්ගෙන් පෙර සිරිත් අනුව රජයට ලබාගත යුතු සේවා පිළිබඳ සොයා බලා ඇති අතර ගොවිගම කුලයේ පැවති උප කොටස් හා එහි කාර්යභාරයන් පිළිබඳව දක්වා ඇති තොරතුරු අනුව එම වෙනස්වීම පැහැදිලි වන අතර ගොවිගම කුලයේ සම්ප්‍රදායික කාර්යභාරය තේරුම් ගැනීමට උපකාරී වේ. එනම්,

1. අප්පුහාමිලා :- ඇතුන් ඇල්ලීමට සහයවීම සහ ආණ්ඩුකාර තුමාගේ නිවාසය සම්බන්ධයෙන් කැලැක්ටර් තැන හෝ මුදලිවරු නියම කළ විට කටයුතු කිරීම. මේ අයට සේවා පරවේනි ඉඩම් හිමිවිය. වැටුප් ලැබුණේ නැත.
2. හේවා පන්නේ :- මොවුහු රජයේ දේපළ මුරකිරීම හා ගෙනයාම, රජයේ දැව ඇදීම, ජල මාර්ග කැපීම හා ශුද්ධ කිරීම, කොටු සහ ගෙවල් ඉදිකිරීම, ආදී කටයුතු වලට යොදා ගැණුනි. මොවුන්ට ද හේවා පරවේණි හිමිවිය.
3. ගමරාළලා :- වැදගතුන් තම පෙදෙස් වලින් යනවිට ආහාර සැපයීම, තාවකාලික තානායම් තැනීම හා ඇතුන් ඇල්ලීමට ද, රජයේ දැව ඇදීමටද සහය වීම, මොවුන්ගේ රාජකාරියයි.
4. නයිදෙලා හෙවත් පොරොවකාරයෝ :- බඩු බාහිරාදිය ගෙනයාම, පන්දම් ඇල්ලීම හා තාවකාලික මඩු සෑදීම, මොවුන්ගේ කාර්යභාරයයි. මිල නොගෙන තොරන් බැඳීමටද බැඳී සිටියි. ඕලන්ද සමයේ දී රයිගම් කෝරළේ නයිදෙලා දොළොස් දෙනෙක් වේවැල් කැපීමට ද, නයිදෙලා සදෙනෙක් අඟුරු ලබා ගැනීම සඳහා දැව කැපීමටද, ගල්පාත, මදුරාවෙල විසූ නයිදෙලා රජයේ දැව ගොඩබෑමටද යොදවන ලදහ.[23]



ඉහත තොරතුරු අනුව පහතරට මුහුදුබඩ ප්‍රදේශ යුරෝපීයන් අතට පත්වීමෙන් පසු ගොවිගම කුලයේ උප කොටස් වල කාර්ය භාරය විවිධ වූ බව පෙනේ. ඒ අනුව ගොවිගම කුලය පසු කාල වන විට කාර්යන් රාශියක් ම ඉටුකළ පිරිසක් වූ බව පැහැදිලිය.

පහතරට තංගල්ල ප්‍රදේශය කුළ පිළිබඳව තංගල්ලේ කැලැක්ටර් තැන්පත් ජේ.ඒ. ෆැරල් විසින් 1818 දී වාර්තාවක් සපයන ලදී. තංගල්ල දිස්ත්‍රික්කයේ ස්වදේශීන්ගේ විවිධ කුල පිළිබඳව එහි තොරතුරු දක්වන අතර වෙල්ලාල හෙවත් ගොවිගම කුලය පිළිබඳවද අවධානය යොමුකරමින් එම කුලයේ කොටස් පහක් සහ ඊට අදාල කාර්යභාරයන් දක්වා තිබේ. ඒ මගින් ද ගොවිගම කුලයේ කාර්යභාරය වඩවඩාත් දැකිය හැකිය. එනම්,

1. හේවා පන්නේ :- කැඳවනු ලැබූ විට සේවාකමෙහි යෙදීමට යටත්ය. පොදු වැඩ සඳහා දැව ඇදීමටද බැඳී සිටිත්.
2. ගමරාළලාගේ ඥාතීහු :- පොදු වැඩ, බඩු බාහිරාදිය ගෙනයාම, කුරුඳු වැවීම හා නයිදෙලා උඩුවියන් කාරයෝ නැතිනම් පල්ලැක්කි ගෙනයාම, යන කටයුතු වලට මොවුන් යෙදීය. එහෙත් මේ සියල්ල තම කොටසේ දී හෙවත් තානායමේ දී පමණක් සිදුකළේය.
3. බදන්නෝ :- ප්‍රධාන කාර්ය ඇතුන් ඇල්ලීමයි. දිස්ත්‍රික්කයේ පොදු වැඩ හා ලුණු එකතු කිරීම සඳහා කැඳවනු ලැබිය හැකිය.

4. නයිදෙලා :- දෝලි (පල්ලැක්කි) ගෙනයාම හැර අන් කවර කටයුත්තක් සඳහා වුවද දිස්ත්‍රික්කයේ මෙන්ම ඉන් පිටත දී ද සේවයෙහි යෙදිය හැක.

5. ඌලියන්කාරයෝ : හැම සේවයක්ම කිරීමට බැඳී සිටින කුලීකාරයන්ය.[24]

මාතර කැලැක්ටර් තැන්පත්ව සිටි ජෝන් ජී ෆෝර්බස් විසින් 1818 දී සපයන ලද විස්තර වාර්තාව තුළින් ද ගොවිගම කුලයේ සාම්ප්‍රදායික කාර්යභාරය වටහාගත හැකිය. එහි දී ඔහු ගොවි වංශය හෙවත් වෙල්ලාල කුලය නමින් හඳුන්වා ඇත. මෙම කුලයේ මුලාදෑනිහු, යාපාහාමි, පතිරනහාමි, ගමරාළ, විතාරන්නා, ලියන්නා, මහන්නා යනුවෙන් පන්ති හතකට බෙදා දක්වා ඇත. මෙම කුලයේ පිරිස ගොයම් කිරීම විශේෂයෙන් රජකු සතු කුඹුරු පිළිබඳව වැඩ නිසිලෙස කෙරේදැයි පරීක්ෂා කිරීමට බැඳී සිටිති. වී වැපිරීම, ගොයම් කැපීම හා කොළ පෑගීම, සුදුසු කාලයෙහි කරවා ඒ පිළිබඳ විස්තරයක් උසස් මුලාදෑනින්ට හා කොමිෂනර් අප්පුලාට දීම ඔවුන්ට නියමිත කාර්යයකි. එනම්, දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම - පිළිබඳව සාමාන්‍ය පරිපාලනයක් ඔවුන් සතු විය. අටුවල රැස්වන රජයේ වී බලා ගැනීමද ඔවුන් සතු කාර්යයකි. ආණ්ඩුකාරතැන, දිසාවේ, කෝරළේ, මුදලි, පත්තුවේ මුදලි ආදීන් රාජකාරී සඳහා යම්කිසි ගමකට පැමිණෙන විට ඔවුන් සඳහා යහපත් නවාතැනක් පිළියෙල කරවීම ද ගමේ රජකයා ලවා සුදු පිළියෙන් වියන් බැඳවීම හා එහි ඇඳ පුටු ආදියට පිරුවට ඇතිරවීම ද ඔවුන් විසින් කළ යුතුය. මහමුදලි, අතපත්තු මුදලි, තෝල්ක හා මුහන්දිරම් යන නිලධාරීන් රාජකාරිය සඳහා රටමැද යනවිට ඉහත කී පරිදි කටයුතු කිරීම ද, දිනකට දෙවරක් අඩුක්කු හෙවත් පිසූ ආහාර සහ පැසිදුම් හෙවත් අමු ආහාර ද්‍රව්‍ය සැපයීම ද, ඔවුන්ට භාර විය. පළාතේ ඇති තානායම් සඳහා අවශ්‍ය සේවාවන් කිරීමට ද ඔවුහු බැඳී සිටිති. ඇතැම් ගම්වල මුලාදෑනීන්ගේ සේවාව ලැලි හා රිප්ප යම් තරමින් සැපයීමට සීමිතය.

දිසාවේගේ නියමය පිට මුදලිවරු තම ගම් සඳහා, කිරීමට නියෝග කරන සියළු ම සේවාවන් ද ඉටු කරති. ගම් මුලාදෑනීන්ට



සහාය වන අය පුරවැඩකාරයෝ නමින් හැඳින්වීය. රජයේ දුව ආදිය සඳහා හේන් අයිතිකාරයන් ලවා කැලෑව ශුද්ධකරවීම ද ඒ සඳහා රජයේ ඉඩම් තමන් විසින්ම ශුද්ධ කිරීම ද, දුව ගංගාව කරා ඇදගෙන යාමට සිදුරු සෑදීමද, දුව පාකර යැවීමට පහුරු සෑදීම ද, ඔවුන්ට භාර කටයුතු විය.[25]

හේවාපන්නේ උප කුලය ද ගොවිගම කුලයට අයත් කොටසකි. එහි අතපත්තු රංචු, කොඩිතුවක්කු රංචු, වෙඩික්කාර රංචු අධිකාරිමඩු රංචු වශයෙන් කොටස් හතරකින් සමන්විතය. අතපත්තු හේවා පන්නේ දිසාව, මහමුදලි, අතපත්තු මුදලි යන අයගේ ආරක්ෂක පිරිසක් වශයෙන් ක්‍රියාකිරීමට බැඳී සිටියි. දෙවැනි තෙවැනි පන්තිවලට අයත් හේවාපන්නකාරයෝ මුරගෙවල් තුනේ මුර කිරීමට ද, දෙවැනි පන්තියට අයත් හේවා පන්නකාරයෝ හිර කාරයින් රැකබලා ගැනීම, ආණ්ඩුකාරතැන, අණදෙන නිලධාරීතැන, දිශාවේ මග පැමිණෙන විට කොඩිතුවක්කු ගෙන යාම යන සේවා සඳහා බැඳී සිටියි. අතපත්තු හේවාපන්න කාරයෝ අතපත්තුවේ බෙර සමඟ යාමටත්, අධිකාරි මඩුවේ හේවාපන්න කාරයෝ, දිසාවේගේ ආඥා ඒ ඒ මුදලිවරුන් වෙත ගෙන යාමටත් බැඳී සිටියි. දිසාවේගේ භෝජනය සඳහා දෙපා දඩමස් දිනපතා ද, සිව්පා දඩමස් අට දිනකට වරක් ද සැපයීම හා තම මුහන්දිරම් යටතේ මුර කිරීම ද වෙඩික්කාර හේවාපන්නකාරයින් ගේ කාර්යභාරයයි. මුරගෙවල් පිහිටුවා ඇති කඩවත් හා අන්‍ය ස්ථානයන්හි මුර සේවයේ යෙදීම කෝරළේ හේවාපන්නකාරයන් ගේ කටයුතුය.[26]

රජය සතු ගවයින් බැඳීම, රැකබලා ගැනීම හා රජයේ සේවයට අවශ්‍ය විට ඔවුන් ගෙන ඒම පට්ටිකාරයින් ගේ සේවය විය. අවශ්‍ය විට කිරි හා වසු පැටවුන් මොවුන් විසින් සැපයිය යුතුය. බඩු බාහිරාදිය ගෙනයාම, තානායම් ඉදිකිරීම හා ඒවාට අවශ්‍ය භාණ්ඩ සැපයීම නයිදෙලා විසින් කරන ලදී. සෙල්ලක්කාර නමින් හැඳින් වූ පංතියට නියමිත රාජකාරියක් නැතත් ජන්මය අනුව ගම වෙනුවෙන් සේවය කළ යුතුය.[27]

ඉහත තොරතුරු අනුව සිංහල කුල ක්‍රමය තුළ ගොවිගම කුලයට අයත් කාර්යභාරය පැහැදිලිය. උඩරටත්, පහතරටත්,

දෙපළාතේම ගොවිගම කුලය විවිධ උප කුලවලට බෙදී විශාල රාජකාරියක් සිදුකර ඇති බව පෙනේ. ගොවිතැන ප්‍රධාන කරගත් විවිධ සේවා රැසක් ගොවිගම කුලය හා සම්බන්ධ උපකුලයන් මගින් සිදුකර ඇති බව ඉහත තොරතුරු අනුව පැහැදිලිය. ඒ අනුව ගොවිගම කුලයේ සාම්ප්‍රදායික කාර්යභාරය කුමක් දැයි වටහා ගැනීමට පුළුවනි.

## ආන්තික සටහන්


1. විමලානන්ද, තෙන්නකෝන්, උඩරට කැරැල්ල, තුන්වන කාණ්ඩය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1963, පිටුව 272.
2. - එම - පිටුව 272
3. Dymont, Louis, Homo Hierarchicys, The Caste System And Its Implications, Chicago University Press, Chicago, 1980, Page 215
4. සිල්වා, කාලිංග, ටියුඩර්, කුලය පන්තිය හා වෙනස්වන ලංකා සමාජය, ප්‍රජා අධ්‍යයනය කවය, මහනුවර, 1997, පිටුව 24.
5. එම - පිටුව 27
6. එල්ලාවල, හේමා,පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. කොළඹ පිටුව
7. සිල්වා, කාලිංග, ටියුඩර්, කුලක්‍රම ගැන මූලික හැඳින්වීමක්, සමාජ විමසුම 7. සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙනිය 1990 පිටුව 1
8. කරුණාතිලක, පී. වී. බී. පැරණි ලංකාවේ කුල හා සමාජ ප්‍රභේද, සමාජ විමසුම 7, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙනිය, 1990, පිටුව 160.
9. ආරියපාල, එම්.බී, මධ්‍යකාලීන ලංකා සමාජය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ. 1962, 150
10. පීරිස්, රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය, සමන් ප්‍රකාශකයෝ කොළඹ, 1964 පිටුව 184.
11. සිල්වා, කාලිංග, ටියුඩර්, කුලය පන්තිය හා වෙනස්වන ලංකා සමාජය, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2005, පිටුව 34.
12. සිල්වා, එම්. යු.ද, ''ශ්‍රී ලංකාව කුල වැඩවසම් ක්‍රමය'' අභය මුද්‍රණ ශිල්පියෝ, කඩවත. 1998, පිටුව 94
13. එම - පිටුව 95
14. එම - පිටුව 95
15. එම - පිටුව 96





16. Kulasekara, K.M.P, The Caste System And The Britist Administration in The Kandyan Provinces of Sri Lanka, Journal of Hymanities and Social Sciences of the University of the, Kalaniye, Vol 111, 1984/1985 Page, 205.
17. Knox, Robert, An Historical Relation or the Isaland of Ceylon, 1989, P. 106.
18. De silva, Colvin R., Ceylon Under the Britist. Occypation, VOI I, Colombo, 1953, P 130.
19. Pieris, Ralph, Sinhalese Social Organisation, The Kandyan Period Colombo - 1956, P 172.
20. සිල්වා, එම්. යු.ද, ''ශ්‍රී ලංකාව කුල වැඩවසම් ක්‍රමය'' අභය මුද්‍රණ ශිල්පියෝ, කඩවත. 1998, පිටුව 98
21. විජයතුංග, හරිස්චන්ද්‍ර (සංස්), නීති නිගන්ඩුව, එස්. ගොඩගේ සහෝදරයෝ, මරදාන, 1998 පිටු 13,14
22. විමලානන්ද, තෙන්නකෝන්, උඩරට කැරැල්ල, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1963, පිටුව 274
23. එම - පිටු 278 - 279
24. එම - පිටුව 282 - 283
25. එම - පිටුව 284 - 285
26. එම - පිටුව 286
27. එම - පිටුව 286